කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී (ගෞරව) උපාධි පරීක්ෂණය, තෙවන වසර

පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2025

**LAW 31210 - විකල්ප ආරවුල් විසඳීමේ නීතිය**

(පැ 2 යි මිනිත්තු 15 යි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 04

ඕනෑම ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1.සංවර්ධනය වෙමින් පවතින දේශයක් වන සෝමියා ජනරජය, ආර්ථික වර්ධනය තීව්‍ර කිරීම සඳහා දේශසීමා හරහා වාණිජ කටයුතු වැඩි දියුණු කිරීමට කැපවී සිටින රජයක් මැතකදී තෝරා ගෙන තිබේ. කෙසේ වෙතත්, වාණිජ ආරවුල් නිරාකරණය කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් හේතුවෙන් සැලකිය යුතු නඩු ප්‍රමාණයක් ගොඩගැසී ඇති බැවින් රටේ අධිකරණය අධික ලෙස පීඩාවට පත්ව ඇත. මෙම තත්ත්වය විදේශීය ආයෝජකයින් වැළැක්වීම, වෙළඳ සාකච්ඡා මන්දගාමී කිරීම සහ ජාත්‍යන්තර ගනුදෙනු ආශ්‍රිත දේශීය ව්‍යාපාර සඳහා අවිනිශ්චිතතා ඇති කළ හැකිය. මෙම අභියෝග හඳුනා ගනිමින්, රජය වාණිජ සමථකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් විකල්ප ආරවුල් නිරාකරණ යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ සලකා බලමින් සිටියි.

සෝමියා රජය ඔබව පර්යේෂකයෙකු ලෙස පත් කර ඇතැයි උපකල්පනය කරමින් සෝමියා රාජ්‍යය සන්දර්භය තුළ දේශසීමා හරහා ආරවුල් නිරාකරණය සඳහා වාණිජ සමථකරණයේ යෝග්‍යතාව, සහ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම සඳහා ගෝලීය යහ භාවිතයන් (international best practices) සෝමියාවට යොදාගත හැකි ආකාරය දැක්වෙන වාර්තාවක් සකස් කරන ලෙසත් ඔබෙන් ඉල්ලා ඇතැයි සිතන්න. සුදුසු අධිකාරීන් දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

සෝමියා ජනරජයේ නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය හා සමාන වේ යැයි උපකල්පනය කරන්න.

(මුළු ලකුණු 30)

2. සාකච්ඡා කිරීම නීති වෘත්තියේ අත්‍යාවශ්‍ය කුසලතාවක් වන අතර, එමඟින් පාර්ශ්වයන්ට සුහදව ආරවුල් විසඳා ගැනීමට ඉඩ ලබා දෙමින්, මිල අධික හා කාලය ගතවන නඩු පැවරීම්වලට යොමු නොවී

සිටීමට හැකියාව ලැබේ. කෙසේ වෙතත්, සාකච්ඡා කිරීම මගින්, බල අසමතුලිතතාව සහ සදාචාරාත්මක උභතෝකෝටිකයන් (potential ethical dilemmas) උද්ගත වීමද වැනි අභියෝග ද හට ගත හැකි අතර, ඒවා විවේචනාත්මකව පරීක්ෂා කළ යුතුය.

ඉහත ප්‍රකාශය කෙරෙහි අවධානය යොමුකරමින් නීතිමය සන්දර්භය තුළ මූලික ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් ලෙස, සාකච්ඡා කිරීමේ කාර්යභාරය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 30)

3.ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් වන Delta PLC සහ ඉන්දියාවේ සංස්ථාපිත සමාගමක් වන Meta Ltd, කොළඹ අලුතින් ඉදිකරන ලද 'Nation of Dreams' නමැති සර්වසම්පූර්ණ (integrated) නිවාඩු නිකේතනයක මෙහෙයුම් කළමනාකරණය කිරීම පිණිස කළමනාකරණ ගිවිසුමකට ('the MA') එළැඹුණි. MAට අනුව, Meta Ltd, Delta PLC සහ අනුබද්ධිත සමාගම් හතරට කළමනාකරණ සේවා සැපයීමට නියමිතව තිබුණි. MA සහ පසුව ඊට කරන ලද සංශෝධන වල ප්‍රතිඵලයක් ලෙස, Meta Ltd කළමනාකරණයේ සම්පූර්ණ පාලනය ලබා ගත්තේය. මූල්‍යමය ගැටළු සහ Delta PLC හි අධ්‍යක්ෂවරුන්ගේ විෂමාචාරය Meta Ltd සමාගම වෙත ව්‍යාපාර මෙහෙයුමේ සම්පූර්ණ පාලනය ලබා ගැනීමට හේතු විය. කෙසේ වෙතත්, Delta PLC හි අදහස වූයේ Meta Ltd හි ක්‍රියාකලාපය මූලික කළමනාකරණ ගිවිසුම උල්ලංඝනය කිරීමට හේතු වී ඇති බවය. ඉහත ගිවිසුමේ 15 වන වගන්තියේ සඳහන් වූයේ: "මෙම ගිවිසුම යටතේ පැන නැගෙන ඕනෑම ආරවුලක් බේරුම්කරණය සඳහා, කොළඹ ජාත්‍යන්තර ADR මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතු අතර, එහි තීරණය බැඳ තැබෙන (binding) සහ අවසානාත්මක වේ." ගිවිසුම කඩ කිරීම පිළිබඳ චෝදනා ඉස්මතු කර දක්වමින් Delta PLC විසින් Meta Ltd වෙත බේරුම්කරණ දැන්වීමක් නිකුත් කළේය. එම ව්‍යාපාරික මෙහෙයුම සමඟ සමීප සබඳතා පැවැත්වූ ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂයක්, කළමනාකරණ ගිවිසුමට එළඹීමට Delta PLC වංචනික ලෙස පොළඹවා ඇති බැවින් ප්‍රශ්නගත ආරවුල වලංගු ගිවිසුමක් යටතේ හට නොගත් බව, Meta Ltd මතය විය. පසුව, දෙපාර්ශවය බේරුම්කරුවන් පත් කළ අතර, බේරුම්කරණ සභාව පිහිටුවන ලදී. පවත්නා තත්වය තවදුරටත් උග්‍ර කරවන බැවින්, Delta PLC ශ්‍රී ලංකාවේ සැපයුම්කරුවන් සමඟ තවදුරටත් ගිවිසුම්වලට එළැඹීම වැලැක්වීමට Meta Ltd සමාගමට අවශ්‍ය විය. එබැවින්, Delta PLC සමාගමට එරෙහිව නියෝගයක් මේ සම්බන්ධයෙන් ලබා ගැනීම සඳහා Meta Ltd බේරුම්කරණ සභාවට අයදුම් කළේය. බේරුම්කරණ සභාවේ සභාපති වරයා එම අයදුම්පත ප්‍රතික්ෂේප කළේය. බේරුම්කරණ සභාව තමන් වෙත අධිකරණ බලය ඇති බව තීන්දු කළ අතර Delta PLC වෙත සැලකිය යුතු වන්දි ප්‍රදානය කළේය. කෙසේ වෙතත්, Meta Ltd අවසාන ප්‍රතිඵලය පිළිබඳව සෑහීමකට පත් නොවන අතර එම බේරුම්කරණ ප්‍රදානය අභියෝග යට ලක් කිරීමට අපේක්ෂා කරයි.

ඉහත සිද්ධිය ආශ්‍රිතව පැන නැගෙන නීතිමය ගැටළු සාකච්ඡා කර පාර්ශවයන් වෙත උපදෙස් දෙන්න. සුදුසු අධිකාරීන් සමඟින් ඔබේ පිළිතුරට සහාය දක්වන්න.

(මුළු ලකුණු 30)

4. මෑත වසර වලදී විකල්ප ආරවුල් නිරාකරණය (ADR) සැලකිය යුතු පරිවර්තනයකට භාජනය වී ඇති අතර, තාක්ෂණික දියුණුව, ගෝලීයකරණය සහ පරිණාමය වෙමින් පවතින සමාජ අවශ්‍යතා මගින් එය මෙහෙයවනු ලැබේ. සමථකරණය සහ බේරුම්කරණය වැනි සාම්ප්‍රදායික ක්‍රම, දැන් මාර්ගගත ආරවුල් නිරාකරණය (ODR) සහ දෙමුහුන් (hybrid) යාන්ත්‍රණ, වැනි නව්‍ය ප්‍රවේශයන් මගින් වඩාත් නම්‍යශීලී සහ ප්‍රවේශ්‍යතාවක් ලබා දෙමින් දියුණු වී ඇත. සංස්කෘතික, තාක්ෂණික සහ ආයතනික සාධක තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන, විශේෂයෙන්ම ශ්‍රී ලාංකික නීතිමය සන්දර්භය තුළ මේ නැගී එන ප්‍රවණතා යුක්තිය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කරන්නේ කෙසේද යන්න පිළිබඳව, මෙම පරිණාමය වැදගත් ප්‍රශ්න මතු කරයි.

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. අදාළ නීතිමය උපකරණ, නඩු තීන්දු සහ සංසන්දනාත්මක නිදසුන් සුදුසු ලෙස භාවිත කරන්න.

(මුළු ලකුණු 30)

************